ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1996 අංක 18 දරන
# ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන
# අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 අගෝස්තු මස 02 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: රු. 1.65 ශ.   තැපැල් ගාස්තුව: රු. 2.55 ශ.

## 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 1 වන දින]

එල්. ඩී.—ඕ. 42/95

**ශ්‍රී ලංකාවේ දක්ෂිණ ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

*ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිහිටුවීම.*

2. (1) 4 වන වගන්තිය යටතේ සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය (1) වන උපවගන්තියෙන් දෙනු ලැබූ නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අඛණ්ඩ පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී සංස්ථා නාමයෙන් ඒ අධිකාරිය විසින්ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

*අධිකාරියේ නාම කළ ප්‍රදේශය.*

3. (1) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින් මතු "නම් කළ ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදේශ තුළ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම අධිකාරියේ වගකීම වන අතර, තත් කාර්යය සඳහා මේ පනත මගින් අධිකාරිය වෙත පවරා දෙනු ලැබූ හෝ පනවනු ලැබූ බලතල, කාර්ය සහ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම අධිකාරිය විසින් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන එසේ වුව ද නම් කළ ප්‍රදේශයෙන් පිටත යම් කාර්යාලයක් හෝ ගබඩාවක් අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලැබිය හැකි අතර, මේ පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වන වැඩ කටයුතු කිසිවක් ඒ නම් කළ ප්‍රදේශයෙන් පිටත දී අධිකාරිය විසින් කළ හැකි ය.

*අධිකාරියේ සාමාජිකයන්.*

4. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් අධිකාරිය සමන්විත විය යුතු ය:—

(අ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක් ;

(ඇ) මෙහි මින්මතු "පත් කරනු ලැබූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස් දෙනෙක්.

අධිකාරියේ සභාපතිවරයා.

5. (1) අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා අධිකාරියේ සියලුම රැස්වීම්වල මූලසුන දැරිය යුතු අතර, ඔහු නොපැමිණ සිටි අවස්ථාවක දී ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ සාමාජිකයන්ගෙන් කෙනකු ඒ රැස්වීමේ මූලසුන දැරීමට තෝරා පත් කරගත යුතු ය.

(3) රෝගී භාවය හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටීම හෝ නිසා තම ධුරයේ කටයුතු කිරීමට සභාපතිවරයා, තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් සාමාජිකයකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) ජනාධිපතිවරයා විසින්, කිසිදු හේතුවක් නොදක්වා, සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකිය.

(5) ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට කවර වුව ද වේලාවක දී සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබූ විට, ඒ ඉල්ලා අස්වීම බලාත්මක වන්නේ ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය, අධිකාරියේ ඔහු දරන සාමාජිකත්වයේ කාලය ම වන්නේ ය.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය සහ ධුරයෙන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

6. (1) සෑම පත් කළ සාමාජිකයකුම, මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතු කොට ගෙන කලින් තම ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) යම් පත් කළ සාමාජිකයකු විසින්, ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ විට එය බලාත්මක වන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් කිසිදු හේතුවක් නොදක්වා අධිකාරියේ යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, එවැනි ඉවත් කිරීමක් කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කිරීමට භාජනය නොකළ යුතු ය.

(4) ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයෙක්, අධිකාරියේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීමට හෝ වෙනත් කවර වුව ද තත්ත්වයකින් අධිකාරියට සේවය කිරීමට නුසුදුස්සෙක් වන්නේ ය.

(5) පත් කළ සාමාජිකයකු තම ධුරය හිස් කළ අවස්ථාවක දී, එසේ පුරප්පාඩු වූ ධුරය පිරවීම සඳහා වෙනත් යම් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, ඔහු අනුප්‍රාප්ත වූයේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති ධුර කාලය සඳහා පමණක් ඒ තැනැත්තා විසින් ධුරය දැරිය යුතු ය.

(6) රෝගී භාවය, ජනරජයෙන් බැහැර ගොස් සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කටයුතු කිරීමට පත් කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

7. යම් තැනැත්තකු— සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම්.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කොට හෝ ප්‍රකාශ කොට ඇති තැනැත්තකු වේ නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ බුන්වත් භාවයෙන් හෝ බංකොලොත් භාවයෙන් නිදහස් නොකරන ලද තැනැත්තකු වේ නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් විඳිමින් සිටින හෝ විඳ සිටින තැනැත්තකු වේ නම්

ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ අධිකාරියේ සාමාජිකයකු වශයෙන් සිටීමට නුසුදුස්සෙක් වන්නේ ය.

සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ක්‍රියා සහ කටයුතු අවලංගු නොවන බව.

8. අධිකාරියේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ අධිකාරියේ යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුකොටගෙන අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුතු කිසිවක් අවලංගු නොවන්නේ ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික සේවා නියම සහ කොන්දේසි.

9. ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික අධිකාරියේ සාමාජිකයන්ට අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල ගණපූරණය.

10. අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය අධිකාරිය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ මුද්‍රාව.

11. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයකට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා සහ අධිකාරියේ තවත් එක් සාමාජිකයකු ඉදිරියේදී මිස අධිකාරියේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි තම නම අත්සන් කළ යුතු ය :

එසේ වුව ද, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීමේ දී එහි පැමිණ සිටීමට සභාපතිවරයාට නොහැකි වන අවස්ථාවක දී, ඒ කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද අධිකාරියේ වෙනත් යම් සාමාජිකයකුට, මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව එවැනි යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් අත්සන් කිරීමට බලය ඇත්තේ ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් අධිකාරිය විසින් පවත්වා ගෙන යා යුතු ය.

### පරමාර්ථ බලතල සහ කර්තව්‍ය

අධිකාරියේ පරමාර්ථ.

12. අධිකාරියේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) නිෂ්පාදනශීලීත්වය නංවාලීම, ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ආදායම් හා රැකියා අවස්ථා ජනනය කිරීම අරභයා වූ සංවර්ධන ව්‍යාපෘති, නම් කළ ප්‍රදේශය තුළ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ආ) නම් කළ ප්‍රදේශයේ සමස්ත සංවර්ධන සැලැස්මෙන් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමුඛත්ව පදනමක් මත සවිස්තර අධ්‍යයන කිරීම ;

(ඇ) යම් නිශ්චිත ව්‍යාපෘති හෝ වැඩ සටහන් සඳහා විදේශීය අරමුදල් සපයා ගැනීමට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම;

(ඈ) (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයන කිරීම සහ නම් කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රාජ්‍ය සංස්ථාවල සහ පොදු හෝ පෞද්ගලික වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම; සහ

(ඉ) (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයන කිරීම සහ නම් කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විදේශීය හා දේශීය පෞද්ගලික අංශයේ නියෝජ්‍යායතනවල සහභාගිත්වය ලබා ගැනීම.

අධිකාරියේ බලතල කාර්ය සහ කර්තව්‍ය.

18. අධිකාරියේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, පහත දැක්වෙන බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම අධිකාරිය විසින් කළ හැකි ය :—

(අ) අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් තාක්ෂණික හා මූල්‍ය ආධාර ලබා ගැනීම;

(ආ) නම් කළ ප්‍රදේශයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අධ්‍යයන කිරීමට සහ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දේශීය හා විදේශීය සහභාගිත්වය ලබා ගැනීම;

(ඇ) නම් කළ ප්‍රදේශයේ කර ගෙන යනු ලබන්නා වූ යම් ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සහයෝගයෙන් ක්‍රියා කරන ලෙස, ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආණ්ඩුවේ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් සියලුම නියෝජ්‍යායතනවලින් ඉල්ලා සිටීම;

(ඈ) අධිකාරිය විසින් කරවන ලද සංවර්ධන ව්‍යාපෘති භාර ගෙන නඩත්තු කර, ක්‍රියාත්මක කරන ලෙස ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව, ආණ්ඩුවේ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටීම;

(ඉ) අධිකාරියේ කර්තව්‍ය කිරීමට අදාළ යම් කටයුතු සම්බන්ධයෙන් අධිකාරියේම දෙපාර්තමේන්තු හෝ නියෝජ්‍යායතන පිහිටුවීම;

(ඊ) නම් කළ ප්‍රදේශයේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අදාළ පර්යේෂණ පැවැත්වීම;

(උ) නම් කළ ප්‍රදේශය තුළ වූ යම් සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් පිළියෙල කිරීම;

(ඍ) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ සහ සේවා ලබා ගැනීම පිණිස කලින් කල ආණ්ඩුව විසින් නියම කරනු ලබන ටෙන්ඩර් පරිපාටියට අනුකූලව, ටෙන්ඩර් ප්‍රදානය කිරීම ;

(එ) නම් කළ ප්‍රදේශය තුළ අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තුවක් පැනවීම හෝ අය කිරීම ;

(ඒ) යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන යම් කාර්යාල, පිරියත, යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ද්‍රව්‍ය මිලට ගැනීම, අත්කර ගැනීම, ඉදිකිරීම, නඩත්තු කිරීම, ප්‍රතිනිර්මාණය කිරීම හෝ සකස් කර ගැනීම ;

(ඔ) යම් පොදු හෝ පෞද්ගලික ආයතනයක් මඟින් හෝ, පොදු හෝ පෞද්ගලික ආයතන සමග හවුලේ හෝ, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ;

(ඕ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකාවේ ප්‍රභවයන්ගෙන් මුදල් ණයට ගැනීම, මුදල් ලබා ගැනීම හෝ බැඳීම් අත් කර ගැනීම ;

(ක) නිශ්චල දේපළ කිසිවක් කවර වුවද ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බදු ගැනීම හෝ කුලියට ගැනීම හෝ බදුදීම හෝ කුලියට දීම, උකස් කිරීම, බඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම ; සහ

(ඛ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව අධිකාරියේ පරමාර්ථ ඉටු කර ගැනීමට හෝ මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා කිරීම.

අධිකාරියේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලවල් යෙදීම සහ ගිවිසුම් ඇති කර ගැනීම.

14. 13 වන වගන්තියේ විධිවිධාන කෙසේ වුවද අධිකාරියේ කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලවල් සහ ගිවිසුම්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථා සමග මෙන්ම හවුල් ව්‍යවසායන් ඇතුළුව වෙනත් පොදු හෝ පෞද්ගලික ආයතන සමග ද අධිකාරිය විසින් ඇති කර ගනු ලැබිය හැකි ය.

අධිකාරිය වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ක්‍රියා කිරීමට තැනැත්තන්ට බලයදීම.

15. ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී අධිකාරිය සඳහා හෝ අධිකාරිය වෙනුවෙන් කටයුතු කිරීමට පොදුවේ හෝ යම් නිශ්චිත කාරණයක් වෙනුවෙන් හෝ යම් තැනැත්තකුට අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, අධිකාරියේ මුද්‍රාව යටතේ ලිය විල්ලකින් බලය පවරනු ලැබිය හැකි ය.

ඇතැම් දෙපාර්තමේන්තු සහ සංස්ථා සම්බන්ධයෙන් අධිකාරියට ඇති විශේෂ බලතල.

**16.** (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන අවස්ථාවක දී, නම් කළ ප්‍රදේශය තුළ හෝ ඒ ප්‍රදේශයට අදාළ හෝ යම් සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් විසින් කළ යුතු යයි අධිකාරිය තීරණය කරන කර්තව්‍ය කිසිවක් කරන ලෙස ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව ඒ දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාවකට නියම කරමින් විශේෂ හෝ පොදු විධාන අධිකාරිය විසින් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් යම් දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාවකට දෙනු ලැබූ විධානයක් ඒ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව විසින් පිළිපැදීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් විධානයක් දෙනු ලැබූ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ඒ විධානයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියේ අධීක්ෂණයට සහ පාලනයට යටත් විය යුතු ය.

ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

**17.** (1) අධිකාරියේ යම් කාර්යයක් සඳහා නම් කළ ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අධිකාරයට අවශ්‍යව ඇත්තා වූද යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අනුමත කර ඇත්තා වූ ද අවස්ථාවක දී, ඒ ඉඩම හෝ ඉඩමක යම් සම්බන්ධතාව පොදු කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබේ. ඒ අනුව, ඒ ඉඩම හෝ යම් ඉඩමක සම්බන්ධතාවක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ, අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා, නම් කළ ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට අවශ්‍යව ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයෙන් පසු අවුරුදු තුනක කාලය ඇතුළත කවර හෝ විටක එකී ඉඩම හෝ එකී සම්බන්ධතාව හෝ අත්කර ගැනීමේ අධ්‍යාශය පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් එකී පනතින් නියම කර ඇති පරිදි පළ කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක දී, ඉඩම් අත්කර ගැනීමේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ඉඩම හෝ ඒ සම්බන්ධතාව වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල නිර්ණය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) ඒ ඉඩම අත්කර ගන්නා අවස්ථාවේ දී ඒ ඉඩම පවත්නා තත්ත්වය, යට කී නියමය කරන ලද දිනයේ දී ඒ ඉඩමේ පැවති තත්ත්වයම වේ නම්, එදිනට ඒ ඉඩමට ලබා ගත හැකිව තිබුණු වෙළඳ අගයට පහත දැක්වෙන මුදල, එනම්, නියමය කරන ලද දිනයට පසුව ඒ ඉඩමට කරන ලද නිර්ව්‍යාජ වැඩිදියුණු කිරීම් කිසිවක් වේ නම්

ඒවා සඳහා යුක්ති සහගත මුදලක්, එකතු කිරීමෙන් ලැබෙන අගය, ඒ ඉඩමේ වෙළෙඳ අගය ලෙස සැලකිය යුතු ය;

(ආ) එකී නියමය කරනු ලැබූ දිනයේ ඒ ඉඩමේ පැවති වෙළෙඳ අගය නිශ්චය කිරීමේ දී, පනත ප්‍රකාර අධිකාරිය විසින් කරනු ලැබ ඇති යම් සංවර්ධන වැඩ හෝ වෙනත් කටයුතු හේතු කොට ගෙන සෘජු ලෙස හෝ වක්‍ර ලෙස උපචිත වූ යම් ප්‍රතිලාභයක් හෝ අගය වැඩිවීමක් හෝ එසේ උපචිත විය හැකි යම් ප්‍රතිලාභයක් නැතහොත් අගය වැඩිවීමක් පිළිබඳ යම් බලාපොරොත්තුවක් සැලකිල්ලට නොගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය සඳහා අත්කර ගනු ලැබූ යම් ඉඩමක් හෝ යම් ඉඩමක සම්බන්ධතාවක් සම්බන්ධයෙන් වන්දි වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවිය යුතු ය.

## මුදල්

**අධිකාරියේ අරමුදල.**

18. (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය. පහත දැක්වෙන මුදල් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරදෙනු ලබන සියලු මුදල් ප්‍රමාණ;

(ආ) අධිකාරිය වෙත සතුව ඇති හෝ අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන යම් දේපළකින් ලැබෙන සියලුම ආදායම;

(ඇ) අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා අධිකාරියට ලැබෙන සියලුම ආදායම;

(ඈ) අධිකාරිය වෙත කරනු ලබන වෙනත් සියලු පරිත්‍යාග හෝ ප්‍රදාන; සහ

(ඉ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්.

(2) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ එහි කටයුතු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන වියදම් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදලින් යම් මුදලක් ආපසු ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය රීති ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව සෑදීමේ බලය අධිකාරිය සතු වන අතර, ඒ රීතිවලට අනුකූලව මිස කිසිදු මුදලක් අධිකාරියේ අරමුදලකින් ආපසු නොගත යුතු ය.

**ඇතැම් කර්තව්‍ය කරන ලෙස රාජ්‍ය සංස්ථා ආදියෙන් ඉල්ලා සිටීමට අධිකාරියට බලය ඇති බව.**

19. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, අධිකාරියේ කර්තව්‍ය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් යම් රාජ්‍ය සංස්ථාවකට හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට අරමුදල් වෙන්කර දෙනු ලැබිය හැකි අතර, ඒ කර්තව්‍ය කිරීම සහ ඒ කර්තව්‍ය කිරීමෙහි ලා දරන ලද යම් වියදම් පිළිබඳව යථා පරිදි ගණන් ඉදිරිපත් කිරීම, අවස්ථාවෝචිත පරිදි. ඒ සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්ය වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අරමුදල් වෙන්කර දෙනු ලැබූ යම් සංස්ථාවක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් ඒ අරමුදල් වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් සැපයිය යුතු යයි අධිකාරිය විසින් නියම කරනු ලබන තොරතුරු අධිකාරිය වෙත සපයන ලෙස එවැනි යම් සංස්ථාවකට හෝ දෙපාර්තමේන්තුවකට නියම කිරීමේ අධිනිර්වාධිකම අධිකාරිය සතු වන අතර, එවැනි නියමයකට අනුකූලව ක්‍රියා කිරීම ඒ සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය වන්නේ ය.

අධිකාරියේ මුදල් වර්ෂය.

**20.** අධිකාරියේ මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණන ක්‍රිය.

**21.** (1) අධිකාරිය විසින් අධිකාරියේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ අනෙක් සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා අදාළ වන්නේ ය.

අධිකාරිය බදු ගෙවීමෙන් නිදහස් වීම.

**22.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද—

(අ) අධිකාරිය විසින් ආනයනය කරනු ලබන හෝ බන්ධිත ගුදම්වලින් මිලට ගනු ලබන කවර වූව ද විස්තරයකට අයත් සියලුම භාණ්ඩ රේගු බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

(ආ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් හෝ අධිකාරියේ නමට හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධක පත්‍රයක් සම්බන්ධයෙන් මේ මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම නිසා නොවේ නම් අධිකාරිය විසින් ගෙවිය යුතු වන මුද්දර ගාස්තුවෙන් අධිකාරිය නිදහස් කරනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් ගනු ලබන ණය සහ ආණ්ඩුවේ ඇපකරය.

**23.** (1) ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානවලින් අධිකාරිය විසින් ලබා ගනු ලබන ණය සඳහා ආණ්ඩුව විසින් නිර්ණය කරනු ලබන නියම සහ කොන්දේසි මත ඇපවීමට ආණ්ඩුවට මෙයින් බලය දෙනු ලැබේ. මේ උපවගන්තිය යටතේ ඇපවීමට බලය දෙන ලද ණය විදේශීය ව්‍යවහාර මුදල්වලින් සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් ඇපයක් යටතේ ආණ්ඩුව විසින් ගෙවනු ලැබිය යුතු සියලු මුදල් ප්‍රමාණ ඒකාබද්ධ අරමුදලට මෙයින් වැයබරක් කරනු ලැබේ.

(3) ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයකින්, (1) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් ඇපයක් මත අධිකාරිය විසින් ගනු ලැබූ යම් ණයක් සම්බන්ධයෙන් මුල් මුදල, පොලිය හෝ වෙනත් අයකිරීම් වශයෙන් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු සියලු මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද—

(අ) ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ යටතේ හෝ පනවා ඇති යම් බද්දක් තීරු ගාස්තුවක් හෝ ගාස්තුවක් සඳහා අඩු කිරීමකින් තොරව හා එවායින් නිදහස්ව ද;

(ආ) ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ යටතේ හෝ පනවා ඇති සියලුම සීමාකිරීම් වලින් නිදහස්ව ද,

ගෙවනු ලැබිය හැකි ය ;

එසේවුව ද, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් නොවන යම් තැනැත්තකු විසින් දරනු ලබන්නා වූ ද ප්‍රතිලාභ හිමිකම් ශ්‍රී ලංකාවේ පදිංචි යම් තැනැත්තකු වෙත ඇත්තා වූ ද යම් බැඳුම්කරයක් හෝ පොරොන්දු නෝට්ටුවක් යටතේ ගෙවිය යුතු වන බදු තීරු ගාස්තු, ගාස්තු හෝ ගෙවීම් පිළිබඳ සීමාකිරීම් හෝ කිසිවකට එම උපවගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පදිංචිය දරන්නේ ද නැති ද යන ප්‍රශ්නය 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව තීරණය කරනු ලැබිය යුතු ය.

(5) මේ පනත ප්‍රකාර ආණ්ඩුව සහ යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර ඇතිකර ගනු ලැබූ සෑම ඇප ගිවිසුමක් ම සහ එවැනි යම් ඇප ගිවිසුමක් ප්‍රකාර ආණ්ඩුව විසින් දෙන ලද සෑම ඇපකරයක් ම ශ්‍රී ලංකාවේ යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඒ ගිවිසුම්වල සහ ඇපකරවල අඩංගු නියමයන්ට අනුකූලව වලංගු සහ බලාත්මක වන්නේ ය.

(6) ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලැබූ යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් අධිකාරියට දෙනු ලැබූ සහ ආණ්ඩුව ඇපවී ඇත්තා වූ යම් ණයක් සම්බන්ධයෙන් වන විට ඒ ණය ප්‍රකාශ කොට ඇති ව්‍යවහාර මුදලට හෝ ව්‍යවහාර මුදල් වලට සාපේක්ෂව රුපියල නැවත අගය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන යම් පාඩුවක් ආණ්ඩුව විසින් දැරිය යුතු අතර, එසේ සිදුවන යම් ලාභයක් ආණ්ඩුවට හිමිවිය යුතු ය. තව ද එවැනි සෑම පාඩුවකම මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට මෙයින් වැය බරක් කරනු ලැබේ.

(7) ආණ්ඩුව සහ යම් දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් අතර ඇති කර ගනු ලබන යම් ඇප ගිවිසුමක් ආණ්ඩුව වෙනුවෙන් අත්සන් කිරීමට ජනාධිපතිවරයාට හෝ තත්කාර්යය සඳහා ජනාධිපතිවරයාගේ අත්සන යටතේ වූ සාධන පත්‍රයක් මඟින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට හෝ මෙයින් බලය පවරනු ලැබේ.

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

**අධ්‍යක්ෂ ජනරාල්වරයා.**

24. (1) සභාපතිවරයා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර, ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා ද වන්නේ ය.

(2) අධිකාරියේ සාමාන්‍ය මෙහෙයවීමට සහ පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම ද අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද අධිකාරියේ නිලධරයන් හා සේවකයන් පිළිබඳ පරිපාලනය සහ පාලනය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය.

(3) මේ පනතින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ භාර කරනු ලැබූ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන යම් අවස්ථාවක දී අධිකාරියේ අනුමතිය ඇතිව, ඔහු විසින් ඒ බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරා දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය ඉටු කිරීම සහ කාර්ය කිරීම කළ යුතු ය.

**අධිකාරියේ කාර්ය මණ්ඩලය**

25. (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන වෙනත් නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ජනාධිපතිවරයාගේ අනුමැතිය ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එසේ තීරණය කරනු ලබන ප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනි කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිස ගෙන සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරන යම් කාලයක්, එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට සේවය කළ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අධිකාරියේ ඉල්ලීම පිට ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ, අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිර්ණය කරනු ලබන කාලයකට, තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එකී පළාත් පාලන ආයතනය එකඟවන නියම සහ කොන්දේසි මත අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(8) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, (7) වන උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වූවද සාමාජිකයකු යටතේ වන විනය පාලනයටම ඔහු යටතේ විය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල නිලධරයන් සහ සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත්කිරීම.

26. (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව

අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වූ නියම සහ කොන්දේසි මත, එවැනිම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව හෝ ස්ථිරවම අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වූව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "පාලක මණ්ඩලය" යන යෙදුම යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් යෙදී ඇති විටක, ඒ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ පරිපාලනය සහ කළමනාකරණය පවරා දී ඇති වෙනත් මණ්ඩලයක් ඉන් අදහස් වේ.

## සාමාන්‍ය විධිවිධාන

අධිකාරියේ බලතල ආදිය පැවරීම.

**27.** (1) අධිකාරිය වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ භාර කොට ඇති බලතල කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, අධිකාරිය විසින් ලිඛිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව, අධිකාරියේ සාමාජිකයකු හෝ සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් පැවරීමක් තිබුණ ද, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ හැකි, ඉටු කළ හැකි හෝ ඉටු කරනු ලැබිය හැකි වන්නේ ය.

සංවර්ධන ව්‍යාපෘති කරගෙනයාම සඳහා දෙනු ලැබූ මූල්‍ය ආධාර එම කාර්ය සඳහා යොදවනු ලබන බවට අධිකාරිය වග බලාගත යුතු බව.

**28.** නම් කළ ප්‍රදේශයේ විශිෂ්ට යම් සංවර්ධන ව්‍යාපෘතියක් කර ගෙන යාම සඳහා අධිකාරිය විසින් යම් පුද්ගලයකුට දෙනු ලැබූ මූල්‍ය ආධාර කිසිවක් ඒ ආධාර දෙනු ලැබූ කාර්ය උදෙසාම යොදවනු ලබන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර අධිකාරිය විසින් ගත යුතු ය.

අමාත්‍යවරයා විසින් අනුමත කළහොත් මිස, අධිකාරියේ සාමාජිකයකුගේ සම්බන්ධතා ඇති ව්‍යවසායක් සමග අධිකාරිය ව්‍යාපාරික කටයුතු නොකළ යුතු බව.

**29.** අධිකාරියේ සාමාජිකයකු හවුල්කරුවකු වන, අධ්‍යක්ෂවරයකු වන හෝ කොටස් හිමියකු වන හෝ අධිකාරියේ සාමාජිකයකුට වෙනත් යම් ආකාරයකින් සෘජුවම හෝ වක්‍රව සම්බන්ධතාවක් ඇති යම් ව්‍යවසායක ආයෝජනයක් හෝ වෙනත් ආකාරයකින් ඒ ව්‍යවසාය සමඟ ව්‍යාපාරික කටයුතු කිසිවක් හෝ ඒ ව්‍යාපාරික කටයුතු සඳහා අමාත්‍යවරයා විසින් අනුමතය දී ඇත්තේ නම් මිස අධිකාරිය විසින් නොකළ යුතු ය.

අධිකාරියේ ක්‍රියාකාරකම් ගැන විමර්ශන නියම කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**30.** අධිකාරියේ ක්‍රියාකාරකම් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට වාර්තා කළ යුතු යයි අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සියලු පහසුකම් අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

**31.** (1) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, අධිකාරියේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන අධිකාරිය වෙත ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන පිළිපැදිය යුතු ය.

(2) අධිකාරියේ දේපළ සහ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයක්ම අධිකාරිය විසින් ඉටුකරනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වන බව.

**32.** අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන්, සේවකයන් යනාදීන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**33.** අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන මත කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

**34.** (1) (අ) අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව

කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ පවරනු ලැබූ සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවනු ලැබූ හෝ අධිකාරිය විසින් අයකර ගනු ලැබූ යම් නඩු ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) උප වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුව හොත්, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකරනු ලැබ නොමැති නම් ඒ වියදම අධිකාරියේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

35. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් හෝ අවශ්‍ය නියෝග, අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කොට ඇති වෙනත් යම් පසු දිනක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. තවද, ඒ නියෝගය මෙහිලා පනවන ලද්දක් මෙන් වලංගු සහ බලසහිත වන්නේ ය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු වුව ද ඒ නියෝගය යටතේ ඊට පෙර කරන ලද යම් දෙයකට හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

36. (1) රීති සෑදීමට නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) අධිකාරිය විසින් සාදනු ලැබූ සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් වෙනත් යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

37. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**අර්ථ නිරූපණය.**

38. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතේ—

"සංවර්ධන ව්‍යාපෘතිය" යන්නෙන් නම් කළ ප්‍රදේශයෙහි නිෂ්පාදනය, ආදායම් හෝ සේවා නියුක්තිය ඇති කෙරෙන හා එමගින් ආර්ථික, සමාජ හෝ පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කෙරෙන පොදු හෝ පෞද්ගලික ක්‍රියාකාරකමක් අදහස් වේ ;

"පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව" යන්නෙහි 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙන් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට, ඉටු කරනු ලබන කාර්යවලට සහ කරනු ලබන කර්තව්‍යවලට අනුරූප හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇති කොට පිහිටුවනු ලැබූ යම් අධිකාරයක් ඊට ඇතුළත් වේ.


දකුණු සංවර්ධන ප්‍රදේශය
ගාල්ල දිස්ත්‍රික්කය
මාතර දිස්ත්‍රික්කය
හම්බන්තොට දිස්ත්‍රික්කය
මොණරාගල දිස්ත්‍රික්කය
රත්නපුර දිස්ත්‍රික්කය
N
Scale
Km 0 5 10 15 20

පාර්ලිමේන්තුවේ සිංහල හැන්සාඩ් කෙටුම්පත්වල සහ හැන්සාඩ්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත ලැබෙන මාර්ගයෙන් දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.